Government of Western Australia
North Metropolitan Health Service

BreastScreen WA
WA's only accredited screening service

# වැඩිදුර පරීක්ෂණ යනුවෙන් කුමක් අදහස්වේද?

**ඔබට වැඩිදුර පියයුරු එක්ස් රේ ඡායාරූප ගැනීමට පැමිණෙන ලෙස දන්වා ඇත. වැඩිදුර පරීක්ෂණ සඳහා පැමිණෙන ලෙස දන්වා සිටින කාන්තාවන් බහුතරයකගේ ප්‍රතිඵල සාමාන්‍යවේ (පියයුරු පිළිකා නොමැත).**

## මා හට නැවත පැමිණෙන ලෙස දන්වා ඇත්තේ ඇයි?

නැවත පියයුරු එක්ස් රේ ඡායාරූප ගැනීමට පැමිණෙන ලෙස දැනුම්දීම අසාමාන්‍ය නොවේ. නැවත පැමිණෙන ලෙස දැන්වීම සම්බන්ධ බහුල හේතු අතර පහත දේ ඇත:

### ඝණත්වය

මැමොග්‍රෑමයක් යනු ඔබගේ පියයුරු පටකවල එක්ස් රේ ඡායාරූපයකි. පියයුරු පටකවල අසාමාන්‍ය ආකාරයේ විහිදී තිබීමක් අසාමාන්‍යතාවයක් ලෙස පෙනිය හැකිය. වැඩිදුර එක්ස් රේ ඡායාරූප මගින් ඝනව ඇති ප්‍රදේශ සාමාන්‍ය ග්‍රන්ථි පටක ලෙස හඳුනා ගැනීමට හැකිවේ.

### සිස්ට්

පැහැදිලි දාර සහිත රවුම් ඝනවූ ප්‍රදේශ සාමාන්‍යයෙන් සිස්ට් හෝ හානිදායක නොවන (පිළිකා රහිත) ගැටිත්තකි. දාර පැහැදිලිව නැතිනම්, වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය විය හැකිය.

### කැල්සීභූතවීම

බොහෝ කාන්තාවන්ගේ මැමොග්‍රෑම් හි කැල්සියම් බිඳිති (කැල්සීභූතවීම්) දැකිය හැකි අතර සාමාන්‍යයෙන් මේවා අහිතකර නොවේ. කෙසේවුවද, අක්‍රමවත් ආකාරයට සිදුවන කැල්සීභූතවීම් පිළිකාවල මුල්ම අවස්ථා විය හැකි අතර වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය විය හැකිය.

### කැළැල්

පියයුරුවල කලින් සිදුකල ශල්‍යකර්මයක් හේතුවෙන් කැළැලක් ඇතිවී තිබිය හැකිය. කැළැල්වූ පටක හේතුවෙන් එක්ස් රේ ඡායාරූප කියවීම වඩා අපහසුවන අතර ඔබ හට වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය විය හැකිය.

### සමෙහි සළකුණු කාරක

පියයුරුවල කැළැල්, මෝල් හෝ රෝග ලක්ෂණ සහිත ප්‍රදේශවල සමෙහි සළකුණු කාරක තැබීම මගින් විකිරණවේදීන් හට එක්ස් රේ ඡායාරූප අධ්‍යයනය කිරීමට උපකාරවේ.

## වැඩිදුර පියයුරුවල ගනු ලබන එක්ස් රේ පරීක්ෂණවල ප්‍රතිඵල මා විසින් දැන ගන්නේ කෙසේද?

ඔබගේ මැමොග්‍රෑම් පරීක්ෂාවේ ප්‍රතිඵල දැනුම් දීමට ඔබට BreastScreen WA වෙතින් දුරකථන ඇමතුමක් ලබාදෙනු ඇත. අමතර පරීක්ෂා නිර්දේශකල හැකි අතර මේවා තීරණය වන්නේ මැමොග්‍රෑම් පරීක්ෂාවේ පෙනුම අනුවවේ. ඔබට නැවත පැමිණෙන ලෙස ඉල්ලා සිටීමට හේතුව අවබෝධකර ගැනීම සඳහා ඔබට අවශ්‍ය තරම් ප්‍රශ්න අසන්න.

ඔබ හට අමතර පරීක්ෂා සිදු කිරීම අවශ්‍යනම්, ඔබගේ වැඩිදුර පියයුරු පරීක්ෂණ සඳහා BreastScreen WA පියයුරු ඇගයීමේ මධ්‍යස්ථානයට යාම සඳහා හමුවක් ලබාදෙනු ඇත. මෙම සේවාව නොමිළේ ලබාදෙන අතර ගම්බද පළාත්වල සිටින කාන්තාවන් හට රෝගීන් සඳහා ගමන් කිරීමට උපකාර ලබාදෙන වැඩසටහන (Patient Assisted Travel Scheme - PATS) යටතේ උපකාර සඳහා සුදුසුකම් තිබිය හැකිය.

## කලින් ඡායාරූප

කරුණාකර කලින් ලබාගත් මැමොග්‍රෑම් සහ අල්ට්‍රාසවුන්ඩ් පරීක්ෂණවල සියළුම ඡායාරූප ලඟ තබා ගන්න. අළුතින් ලබාගත් මැමොග්‍රෑම් පරීක්ෂාවේ ඇති කණස්සල්ලට හේතුවන ප්‍රදේශයක්, දිගුකල් පවතින හානිකර නොවන දෙයක් බවට විකිරණවේදීන් විසින් පෙන්වීම සඳහා කලින් ලබාගත් ඡායාරූප ඉතා ප්‍රයෝජනවත්වේ.

## වෙනත් කුමන වැඩිදුර පරීක්ෂා කිරීම අවශ්‍යවේද?

මැමොග්‍රෑම් පරීක්ෂාවකින් සොයාගත් බොහෝ වෙනස්කම් පියයුරු ඇල්ලීමෙන් හඳුනා ගැනීම අපහසු අතර විශේෂ පරීක්ෂා සිදු කිරීම අවශ්‍යවේ.

### රෝග හඳුනා ගැනීම සඳහා වූ වැඩිදුර මැමොග්‍රැෆි පරීක්ෂා

චිකිත්සක වශයෙන් උනන්දුව ඇති ප්‍රදේශ අරමුණු කරගත් අමතර මැමොග්‍රෑම් පරීක්ෂණ කිරීම මෙහිදී සිදුවේ.

### පියයුරු ටොමොසින්තසිස් / 3 ඩී මැමොග්‍රැෆි පරීක්ෂාව

ත්‍රිමාණ මැමොග්‍රැෆි පරීක්ෂාව (ඩිජිටල් පියයුරු ටොමොසින්තසිස් ලෙසද හඳුන්වයි) සඳහා එක්ස් රේ (මැමොග්‍රෑම්) භාවිතයෙන් විවිධ කෝණවලින් ලබාගත් පියයුරුවල ත්‍රිමාණ ඡායාරූප නිර්මාණය කිරීමට පරිගණක මෘදුකාංග උපයෝගී කර ගනී. සම්මත මැමොග්‍රෑම් පරීක්ෂාවක් මගින් පියයුරුවල ද්විමාණ (2 ඩී) ඡායාරූප ලබාගනී.

### චිකිත්සක වශයෙන් පියයුරු පරීක්ෂාව

විකිරණවේදියෙකු විසින් ඔබගේ ඡායාරූප පරීක්ෂා කිරීමෙන් අනතුරුව චිකිත්සක පරීක්ෂාවක් අවශ්‍යනම්, කාන්තා පියයුරු භෞතවේදියෙකු විසින් ඔබගේ පියයුරු සම්බන්ධ සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකරන අතර ඔබගේ වෛද්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් ඔබ සමඟ කථා කරනු ඇත.

### පියයුරුවල සිදුකරන අල්ට්‍රාසවුන්ඩ්

පියයුරු පටක සම්බන්ධ වැඩිදුර විස්තර පෙන්වන ශබ්ද තරංග භාවිතයෙන් සිදු කරන (සාම්ප්‍රදායික නොවන) පරීක්ෂණයකි. පියයුරුවල ජෙල් තවරා ශල්‍ය උපකරණයක් සමට තබා තද කරනු ඇත.

### ඡායාරූප මගින් නියමු බයොප්සි

පියයුරු බයොප්සියක් යනු පියයුරුවට ඉදිකටුවක් ඇතුළුකර චිකිත්සක වශයෙන් උනන්දුව ඇති ප්‍රදේශයෙන් පටක සාම්පලයක් ලබා ගැනීමවේ. මෙම සාම්පලය පසුව අන්වීක්ෂයකින් පරීක්ෂා කල හැකිවේ.

මෙම ක්‍රියාපාටිය සිදුකරන විකිරණවේදියා විසින් ඉදිකටුව මගින් ලබා ගන්නා සාම්පලය නිසි තැනින් ලබා ගන්නා බවට වගබලා ගැනීම සඳහා අල්ට්‍රාසවුන්ඩ් හෝ එක්ස් රේ උපයෝගී කර ගනී. අදාල ස්ථානයේ නිර්වින්දනයක් කරනු ඇත. ව්‍යාධිවේදියෙකු විසින් පටක පරීක්ෂා කරන අතර ප්‍රතිඵල සාමාන්‍ය වශයෙන් පැය 24 කට පසුව ලබාගත හැකිය.

### සලකුණු කරන ක්ලිපයක්

සමහරවිට එක්ස් රේ නියමු බයොප්සියක් අවසානවූ පසු, ඉතා කුඩා ලෝහ සළකුණු කරන ක්ලිපයක් මගින් අදාල ප්‍රදේශය සළකුණු කිරීම අවශ්‍ය විය හැකිය.

## සියළුම පිළිකා මෙම පරීක්ෂණ මගින් සොයාගත හැකිද?

බොහෝ පිළිකා හදුනාගත හැකි වුවද, කිසිදු පරීක්ෂණයක් මගින් සියළුම පිළිකා සොයාගත හැකි බවට කිසිදු සහතිකයක් නැත. කරන ලද සියළුම නිර්දේශයන් අනුව සියළුම කාන්තාවන් කටයුතු කිරීම වැදගත්වේ.

## ඇගයීම සඳහා පැමිණි අවස්ථාවේදී

ඔබ හට විශේෂඥ ඇගයීම් ලබාදෙන බහු කාර්ය විශේෂඥ මධ්‍යස්ථාන ඇත. එවා කළමණාකරණය කරන්නේ අපගේ විකිරණවේදීන්, ව්‍යාධිවේදීන්, හෙද හෙදියන්, විකිරණ ශිල්පීන්, පියයුරු භෞතවේදීන් සහ ශල්‍ය වෛද්‍යවරු කණ්ඩායමක් මගිනි.

සියළු හමුවීම් උදෑසන පිළියෙල කර ඇත. ඔබගේ සම්පූර්ණ ඇගයීම සඳහා **පැය 8 ක් දක්වා කාලයකට** ඉඩකඩ ලබා දිය යුතුය. ඔබගේ සේවායෝජකයා හට වෛද්‍ය සහතිකයක් අවශ්‍යනම්, කරුණාකර චිකිත්සක කාර්ය මණ්ඩලය හට දැනුම් දෙන්න.

වාහන නැවත්වා තැබීම සඳහා කරුණාකර මුදල් රැගෙන එන්න. නැතිනම්, පොදු ප්‍රවාහන සඳහා දුරකථන අංක 13 62 13 ඔස්සේ ට්‍රාන්ස්පර්ත් අමතන්න.

## ප්‍රතිඵල ඔබගේ වෛද්‍යවරයා වෙත

ඔබ වෛද්‍යවරයෙකු නම්කර ඇතිනම් (එසේ කරන ලෙස අපි ඔබව උනන්දුකරමු) ඔබගේ වැඩිදුර හමුවීම් සම්බන්ධයෙන් ඔවුන් හට දැනුම් දෙනු ඇත. ඔබගේ ඇගයීමේ ප්‍රතිඵලද, ඔබගේ වෛද්‍යවරයා වෙත යවනු ඇත.

## BreastScreen WA

දුරකථන (08) 9323 6700 ෆැක්ස් (08) 9323 6799

ඊමේල් breastscreenwa@health.wa.gov.au

පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service - TIS) 13 14 50

## BreastScreen WA ඇගයීමේ මධ්‍යස්ථාන

### Royal Perth Hospital (RPH) Breast Assessment Clinic

Level 3, North Block. Wellington Street, Perth, 6000




### Sir Charles Gairdner Hospital

G Block, 1st floor, Hospital Avenue, Nedlands.



## BreastScreen WA ඇගයීමේ මධ්‍යස්ථාන

### **Bunbury** South West Health Campus
Corner of Bussell Highway and Robertson Drive




### Fiona Stanley Hospital
**Level 1 Main Hospital, 102-118 Murdoch Drive, Murdoch Tel: (08) 6152 4125**




### Joondalup **57 Joondalup Drive, Joondalup**




BreastScreen AUSTRALIA
A joint Australian, State and Territory Government Program

BEAT BREAST CANCER HAVE A FREE X-RAY RING: 13 20 50

LIKE US ON facebook

**www.breastscreen.health.wa.gov.au**

DEC 2022